කොවිඩ් 19 සති පාසල

සබරගමුව

විෂය- පුරවැසි අධ්‍යාපනය ශ්‍රේණිය - 09 ශ්‍රේණිය වාරය-III
සතිය - 02 සතිය

පාඩම-ගැටුම් නිරාකරණය

<u>ක්‍රියාකාරකම</u>-9.5.2 ගැටුම් නිරාකරණයට යෝග්‍ය ක්‍රමවේද අනුගමනය කිරීම.

<u>හැඳින්වීම</u>- ගැටුම වනාහි පුද්ගලයා තුළ හෝ පුද්ගල කණ්ඩායම් දෙකක් හෝ වැඩි ගණනක් අතර ඇතිවූ යම් මතභේදයක් ප්‍රතිඵලයක් වශයෙන් පැන නගින තත්වයකි.මෙවැනි ගැටුම් අවස්ථාවකදී ගැටුමට සම්බන්ධ පුද්ගලයන් හෝ පාර්ශව අතර පවතින දැඩි ස්ථාවර බව ගැටුම් නිරාකණයේ දී ප්‍රධානතම බාධාවක් වේ.එම බාධා පිළිබඳව හා ගැටුම් නිරා කරණය සඳහා අවශ්‍ය ගුණාංග මෙහිදී හඳුනාගනු ලබයි .

<u>ගුණාත්මක යෙදවුම්</u>- පෙළපොත/පුවත්පත් උපුටන

<u>ක්‍රියාකාරකම සඳහා සිසුන්ට උපදෙස්-</u>

පියවර 1- පෙළපොතේ පිටු අංක 115-116 දක්වා අවබෝධයෙන් කියවන්න.

පියවර 2-_කළින් අවස්ථාවල මෙන්ම,අභ්‍යාස පොත භාවිත කර ප්‍රශ්නය ලියා පිළිතුරු සපයන්න.

<u>ප්‍රශ්නාවලිය</u>.

1. ගැටුම් නිරාකරණය කිරීමේදි මතුවිය හැකි බාධක මොනවාද යන්න පෙළගස්වන්න.
2. 115 හා 116 පිටුවල ඇති කතන්දර දෙක විසඳීම සඳහා විකල්ප විසඳුම් සෙවිය යුතුය.එසේනම් ඒ සඳහා අනුගමනය කළ හැකි විකල්ප (වෙනත්)විසඳුම් මොනවාද?
3. ඔබ මුහුණදුන් ගැටුම් අවස්ථාවක් හෝ ඔබ දැක ඇති ගැටුම් අවස්ථාවක් පිළිබඳව සඳහන් කර එය විසඳීම සඳහා ගතහැකි විකල්ප විසඳුම් අවස්ථා තුනක් සඳහන් කරන්න.
4. ගැටුම් නිරාකරණය සඳහා අවශ්‍ය ගුණාංග 5 ක් ලියන්න.
5. එම එක් ගුණාංගයක් පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්න.

පසු වැඩ
පෙළපොතේ සඳහන් ක්‍රියාකාරකම 5.2 කරන්න.
පාසල ආරම්භ වූ විට විෂය භාර ගුරු භවතාට අභ්‍යාස පොත් පෙන්වන්න.

සැකසීම-එම්.ඒ.පත්මලතා මිය

ර /නිවි/පලාවෙල ශ්‍රී රත්නාකර ම.වි

රත්නපුර